# නාට්‍ය හා රංගකලාව

## 07 ශ්‍රේණිය - දෙවන වාරය

## දසවන පාඩම
## විවිධ නාද අනුකරණය

- ස්වභාවික පරිසරය තුළ විවිධ නාදයන් හා හඬවල් පිරී පවතී. සාවධානව ඇහුම්කන් දෙතොත් අප කිසිදා නෑසූ නාද පවා ඇසිය හැකි ය. එදිනෙදා ජීවිතය හුරු පුරුදු වී ඇති ආකාරයට අප එක විටක සිහියට ගන්නේ නාද/ශබ්ද එකක් හෝ දෙකක් පමණි. අනික් ඒවා සිහියෙන් බැහැර කර සිටීමේ තත්ත්වයකට හුරු වී ඇත. මෙම පාඩමේ දී අප අවට ඇති විවිධ නාද/ශබ්ද ඇසීමටත් ඒවා අනුකරණය කිරීමටත් අනුකරණය තුළින් නාට්‍ය සඳහා ඒවා යොදා ගැනීමටත් උත්සහ කරමු

ක්‍රියාකාරකම 1 :

- ඔබ නිදහස් එළිමහන් ස්ථානයකට ගොස් මද වේලාවක් ඇහුම්කන් දෙන්න. මද වේලාවකින් දෙනෙත් වසා ගෙන ම තමන්ට ඇසුන හඬක් හෝ නාදයක් අනුකරණය කරන්න මේ ආකාරයට සෑම අයෙකුට ම ඇසුණු නාදය බැගින් අනුකරණය කර පෙන්වන්න නමුත්, එක් අයෙක් ඉදිරිපත් කළ නාදය, අනෙක් අය ඉදිරිපත් නොකළ යුතු ය.

    - විවිධ නාදයන් අපට අනුකරණය කළ හැකිය. කටින් සිදුකරන එම අනුකරණයන් වගේ ම යම් උපකරණයක් මගින් ද එය කළ හැකි ය.
    - චලන ක්‍රියා පමණක් නොව විවිධ නාද සහ හඬ ද අනුකරණය කළ හැකි ය.
    - රංගනයේ දී මෙවැනි විවිධ නාදයන් ද අනුකරණය කරන්නට සිදු වේ.
    - මෙසේ විවිධ නාදයන් අනුකරණය කරන විට මුලින් ම මනාවූ නිරීක්ෂණයක් අවශ්‍ය වන අතර ඒ ඔස්සේ නාදය අනුකරණය කිරීම කළ යුතු ය.
    - නාද අනුකරණයේ දී ද හඬ උස් පහත් කිරීම හා විවිධ නාද රටාවන් නිවැරදි ව ග්‍රහණය කරගෙන ප්‍රතිනිර්මාණය කළ යුතු ය.

- වේදිකා නාට්‍යවල සහ ගුවන්විදුලිය නාට්‍යවල මෙවැනි නාද අනුකරණයන් අවස්ථා නිරූපණය සඳහා යොදා ගනී.

**wNHdi**

- විවිධ නාද අනුකරණය කරමින් ගුවන්විදුලි නාට්‍යයක් නිර්මාණය කරන්න
- ඒ සඳහා විවිධ චරිත(මිනිස් හා සත්ත්ව) යොදා ගෙන ඔබ විසින් ම ඒවාට හඬ කවන්න
- ඔබගේ ජංගම දුරකථනයේ පටිගත කරගන්න